# බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ පුහුණු ගුරු තනතුර සඳහා අදාළ පළමුවන හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සඳහා අයදුම්පත් කැඳවීමේ නිවේදනය - 2020

බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ පුහුණු ගුරු තනතුර සඳහා අදාළ වන පළමුවන හා දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ 2020 වර්ෂය සඳහා පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

## 01. සුදුසුකම්

පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට අයදුම්කල හැක්කේ පුහුණු ගුරු තනතුරේ III ශ්‍රේණියේ පත්වීම් ලබා ඇති මෙතෙක් මෙම පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කර නොමැති නිලධාරීන්ට පමණි.

දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට අයදුම්කල හැක්කේ පුහුණු ගුරු තනතුරේ II ශ්‍රේණියට පත් වී මෙතෙක් මෙම දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කර නොමැති නිලධාරීන්ට පමණි.

තවද අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය වන 2021.01.22 වේ.

## 02. අයදුම්පත්

මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආකෘතිය අනුව අයදුම්කරුවන් විසින් සකස් කර ගත් අයදුම්පත් ආයතන ප්‍රධානියා මඟින් 2021.01.22 දින හෝ ඊට පෙර ලැබෙන සේ මා වෙත එවිය යුතුය. ඒ සමග අදාළ ශ්‍රේණියට පත්කළ/ අන්තර්ග්‍රහණය කල ලිපියේ පිටපතක් එවිය යුතුය. සෑම අයදුම්පතකම දක්වා ඇති තොරතුරු නිවැරදි බව ආයතන ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ද, අසම්පූර්ණ හෝ වැරදි සහිත වන අයදුම්පත් ද නැවත දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සැ.යු. ආදර්ශ අයදුම්පතෙහි ආකෘතිය අනුව, අයදුම්පත්‍රය එකම කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් පළමු පිටුවේ අංක 01 සිට 07 දක්වාත් දෙවන පිටුවේ අංක 08 සිට 10 දක්වාත් සකස් කළ යුතුය. ඉහත ආකෘතියට අනුකූල නොවන සියළුම අයදුම්පත්‍ර නැවත දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

## 03. විභාගයට ඇතුලත් කර ගැනීම.

I. පිළිගත් අයදුම්පත් සඳහා අපේක්ෂකයන්ට ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ලැබේ. එම ප්‍රවේශපත්‍ර නියමිත පරිදි සම්පූර්ණ කර විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ නොමැතිව පරීක්ෂණයට පෙනී සිටීමට ඉඩ දෙනු නොලැබේ.

II. විභාග අපේක්ෂක/ අපේක්ෂිකාවන් විසින් විභාග ශාලාධිපති වෙත ස්වකීය අනන්‍යතාවය තහවුරු කල යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියවිලි අතුරින් එකක් ඉදිරිපත් කළ යුතුය.

(අ) ජාතික හැඳුනුම්පත
(ආ) දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරනු ලබන හැඳුනුම්පත
(ඇ) වලංගු රියදුරු බලපත්‍රය
(ඈ) වලංගු විදේශ ගමන් බලපත්‍රය

## 04. විෂයය නිර්දේශය

| කාර්යක්ෂමතා කඩඉම | ප්‍රශ්න පත්‍රය හා අදාළ විෂය නිර්දේශය |
|---|---|
| පළමුවන කාර්යක්ෂමතා කඩඉම (ලිඛිත පරීක්ෂණයකි) | **1. විෂයානුබද්ධ අධ්‍යයනය (කාලය පැය 02 යි. / සමත් ලකුණු 40%)**<br>• ශ්‍රී ලංකාවේ ළමුන් මුහුණපාන ගැටළු හා ඊට විසඳුම්<br>• ළමුන් ආයතනගත වීමට බලපාන හේතු<br>• එක්සත් ජාතීන් විසින් 1989 ප්‍රකාශයට පත් කරන ලද ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය<br><br>**2. ආයතන සංග්‍රහය (කාලය පැය 02 යි. / සමත් ලකුණු 40%)**<br>ආයතන සංග්‍රහයේ II, III, IV, V, VIII, XII, XIII, XIV, XIX, XLVII පරිච්ඡේද හා එම පරිච්ඡේද වලට අදාළව චක්‍රලේඛ මගින් පසුකාලීනව සිදු කරන ලද සංශෝධන ඇසුරින් මෙම ප්‍රශ්න පත්‍රය සකස් කරනු ලැබේ. |
| දෙවන කාර්යක්ෂමතා කඩඉම (ලිඛිත පරීක්ෂණයකි) | **1. විෂයානුබද්ධ අධ්‍යයනය (කාලය පැය 02 යි. / සමත් ලකුණු 40%)**<br>• නොවිධිමත් අධ්‍යාපන ක්‍රම පිළිබඳ අවබෝධය<br>• ළමා මනෝ විද්‍යාව, අධ්‍යාපන මනෝ විද්‍යාව පිළිබඳ දැනුම<br><br>**2. ආයතන සංග්‍රහය හා පළාත් මුල්‍ය රීති (කාලය පැය 02 යි. / සමත් ලකුණු 40%)**<br>ආයතන සංග්‍රහය, බස්නාහිර පළාත් මුල්‍ය රීති පිළිබඳ සාමාන්‍ය දැනීම (ආයතන සංග්‍රහයේ XV, XVI, XXIV, XXVII, XXVIII, XLVII, XLVIII හා මුල්‍ය රීති 130 -196 දක්වා, 215 – 244 දක්වා, 527, 541, 560 – 562 දක්වා වන පරිච්ඡේද හා එම පරිච්ඡේද වලට අදාලව චක්‍රලේඛ මගින් පසුකාලීනව සිදු කරන ලද සංශෝධන ඇසුරින් ප්‍රශ්න පත්‍රය සකස් වේ) |

## 05. විභාග සම්බන්ධ රෙගුලාසි අනුගමනය කිරීම

මෙම විභාගය සම්බන්ධව බස්නාහිර පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු හා සභා කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් නියම කරන ලද නීතිරීති වලට විභාග අපේක්ෂකයින් යටත් වේ. මෙම නීති උල්ලංඝනය කළහොත් විනය බලධරයා විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවනු ඇත. තවද ජංගම දුරකථන හා ඒ හා සමාන සන්නිවේදන හා විද්‍යුත් උපකරණ ද භාවිතා කිරීමෙන් වැළකී සිටිය යුතු වේ.

**06.** මෙම තොරතුරු බස්නාහිර පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෙබ් අඩවියෙන් ද ලබා ගත හැකිය. www.healthmin.wp.gov.lk

මෙම විභාග නිවේදනය සම්බන්ධයෙන් විධිවිධාන සලසා නොමැති කවර කරුණක් පිළිබඳ වුවද, බස්නාහිර පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබ සාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු හා සභා කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වන්නේය.

එච්.ජී.ජී.ජේ. ධර්මසේන
ලේකම්,
සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබ සාධන,
පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු
හා සභා කටයුතු අමාත්‍යාංශය (බ.ප.)

එච්. ජී. ජී. ජේ. ධර්මසේන
ලේකම්
සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුබසාධන,
පරිවාස හා ළමාරක්ෂක සේවා, කාන්තා කටයුතු
සහ සභා කටයුතු අමාත්‍යාංශය
බස්නාහිර පළාත

බස්නාහිර පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ පුහුණු ගුරු තනතුර

සඳහා වන පළමුවන/ දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2020

1. අ. මුලකුරු සමග අගට යෙදෙන නම :.......................................................................................

ආ. සම්පූර්ණ නම : ..........................................................................................................

..........................................................................................................................

2. අ. වර්තමාන තනතුර හා ශ්‍රේණිය :

.........................................................................................

ආ.අදාළ ශ්‍රේණියට පත්කළ හෝ අන්තර්ග්‍රහණය කල දිනය:-..................................................

ඇ. සේවා ස්ථානයේ ලිපිනය:...........................................................................................

..........................................................................................................................

3. ජාතික හැඳුනුම්පත් අංකය :.........................................................................

4. ස්ත්‍රී / පුරුෂ භාවය : ස්ත්‍රී ☐ පුරුෂ ☐

5. ඔබ පරීක්ෂණයට පෙනීසිටින මාධ්‍ය : සිංහල ☐ දෙමළ ☐ ඉංග්‍රීසි ☐

6. දුරකථන අංකය

අ. කාර්යාලය : ..............................................

ආ. පෞද්ගලික : ..............................................

7. අ.ඔබ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ වෙනත් අමාත්‍යාංශයක් (පළාත් / මධ්‍යම) විසින් පවත්වන ලද පුහුණු ගුරු තනතුරට අදාළව ඔබ අයදුම්කරන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සඳහා මීට පෙර පෙනී සිට ඇත්ද? ඔව්/ නැත

ආ. පෙනී සිට ඇත්නම් අදාළ කාර්යක්ෂමතා කඩඉමට අදාළව පහත තොරතුරු සපයන්න.

| පෙනී සිටි කාර්යක්ෂමතා කඩඉම | පෙනී සිටි විෂයන් | අදාළ ප්‍රතිඵල |
|---|---|---|
| පළමු කාර්යක්ෂමතා කඩඉම | | |
| දෙවන කාර්යක්ෂමතා කඩඉම | | |

(අදාළ විභාග ප්‍රතිඵලවල සහතික කල පිටපතක් අමුණන්න.)

8. ඔබ අයදුම්කරනු ලබන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට අදාළව මෙවර පෙනී සිටීමට බලාපොරොත්තු වන විෂයන් ඉදිරියෙන් ( √ ) ලකුණ යොදන්න.

**පළමුවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය**

- විෂයානුබද්ධ අධ්‍යයනය ☐
- ආයතන සංග්‍රහය ☐

**දෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය**

- විෂයානුබද්ධ අධ්‍යයනය ☐
- ආයතන සංග්‍රහය හා පළාත් මුල්‍ය රීති ☐

9. අ. මෙම අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති මාගේ දැනීම හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බවත්,

ආ. මෙම පරීක්ෂණය සඳහා අයදුම්පත් කැඳවූ දිනයේ ප්‍රකාර මා පරීක්ෂණයට පෙනී සිටීමට නුසුදුසු බව පෙනී ගියහොත් පරීක්ෂණයට පෙර හෝ පරීක්ෂණය පැවැත්වෙද්දී හෝ ඉන් පසුව හෝ විභාග අපේක්ෂකත්වය අවලංගු කල හැකි බව මා දන්නා බවත්, මෙයින් ප්‍රකාශ කරමි.

දිනය : ..........................................        ..........................................

අයදුම්කරුගේ අත්සන

10. **ආයතන ප්‍රධානියාගේ දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය:**

........................................................................... මයා/ මිය/ මෙය බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ...................................................... වශයෙන් ............................... දින සිට මෙම ආයතනයේ සේවය කරන බවත්, අදාළ තනතුරේ ..................... ශ්‍රේණියට ............... දින සිට පත් වී ඇති බවත්, අයදුම්පතේ සඳහන් කර ඇති තොරතුරු සියල්ල පෞද්ගලික ලිපිගොනුව අනුව පරීක්ෂා කල බවත්, අයදුම්කරු විසින් පළමුවන/ දෙවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයට නියමිත සුදුසුකම් සපුරා ඇති බවත්, ................................... වැනි දින ඔහු/ ඇය මා ඉදිරිපිට අත්සන් කල බවත් මෙයින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

දිනය :- ..............................................        ..................................................

ආයතන ප්‍රධානියාගේ අත්සන

(නිල මුද්‍රාව තබන්න)

11. **දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය:**

ඒ අනුව මෙම අයදුම්පත මවිසින් ද නිර්දේශ කර අවශ්‍ය කටයුතු සඳහා ඉදිරිපත් කරමි.

දිනය :- ..............................................        ..................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

(නිල මුද්‍රාව තබන්න)